# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1650/20 - 2010 අප්‍රේල් 21 වැනි බදාදා - 2010.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොටගෙන කාත්තන්කුඩි නගර සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මුහම්මදු කාසිම් මුහමදු මන්සූර් නම් වූ සභිකයා අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 3 නම් වූ කණ්ඩායම් නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ කණ්ඩායමට අයත් වන්නා වූ ද, ඒ කාන්තන්කුඩි නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන මුහම්මදු මුස්තපා අබ්දුල් රහුමාන් මහතා ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම්භාර නිලධාරි තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මුහම්මදු මුස්තපා අබ්දුල් රහුමාන් මහතා කාත්තන්කුඩි නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරි,
කාත්තන්කුඩි නගර සභාව.

2010 අප්‍රේල් මස 15 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

05-87


1A - G 12721 — 350 (2010/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.